බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ I වෙනි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරේ සිට විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට උසස් කිරීම - 2026 (2022/12/31 දින සිට 2026/06/30 දින දක්වා)

01. 2013.11.19 දිනැති අංක 1837/8 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා හෙද සේවා ව්‍යවස්ථා සංග්‍රහය, බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ හෙද නිලධාරීන්ට අදාළ වන පරිදි ලබා දී ඇති අනුමැතිය ප්‍රකාරව, අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) හෝ I ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරේ සිටින නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අධි සේවක පදනම මත I ශ්‍රේණියට උසස්වී ඇති හෙද / හෙදි නිලධාරීන්ට මේ සඳහා අයදුම්කළ නොහැක.

02. සුදුසුකම් සලකා බලන දිනයන් :- 2022.12.31 / 2023.06.30 / 2023.12.31 / 2024.06.30 / 2024.12.31 / 2025.06.30 / 2025.12.31 / 2026.06.30

03. පුරප්පාඩු සංඛ්‍යාව :- 08

04. සුදුසුකම් :-

i. පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල / ජාතික හෙද අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන වාට්ටු කළමනාකරණ අධීක්ෂණ (මාස 12) හා වින්නඹු කර්මය / මානසික (මාස 06) අඩංගු අවුරුදු 1 ½ ක ඩිප්ලෝමා පාඨමාලාව හදාරා, I වන ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරක හෝ අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරක හෝ එම තනතුරු දෙකෙහිම හෝ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ කිරීම.

ii. එම වසර 05ක කාලය තුළදී සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කළයුතු වීම හා නියමිත වැටුප් වර්ධක සියල්ල උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්යසාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස් වීමේ දිනට පෙරාතුව වූ වසර පහක (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. පළමුවන ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සමත්වී තිබිය යුතුය.

v. බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම්ගේ පාලන චක්‍රලේඛ අංක 04/2021 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය. ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතු ය.

ඉහත දිනයන්ට පෙර සේවයේ යෙදී සිට ඉන් අනතුරුව සේවයෙන් විශ්‍රාම ගොස් සිටින ඉහත සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ද මේ සඳහා අයදුම්කිරීමට සුදුසුකම් ලබයි.

05. අයදුම්පත් යොමු කිරීමේ ක්‍රමය:-

මෙහි දක්වා ඇති ආකෘතිය අනුසාරයෙන් අයදුම්පත් පිළියෙල කළ යුතුය. 2022.12.31 දිනට හෝ 2023.06.30 දිනට හෝ 2023.12.31 දිනට හෝ 2024.06.30 දිනට හෝ 2024.12.31 දිනට හෝ 2025.06.30 දිනට හෝ 2025.12.31 දිනට හෝ 2026.06.30 දිනට සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් තම අයදුම්පත ආයතන ප්‍රධානීන් මගින් ආවරණ ලිපියක්ද සහිතව ඉදිරිපත් කළයුතුය.

අදාළ දිනයන්ට සුදුසුකම් සපුරා ඇති නිලධාරියෙකු හෝ නිලධාරිනියක සේවයෙන් විශ්‍රාම ගොස් ඇතිවිටදී ඔහු හෝ ඇය අවසන්වරට සේවය කරනු ලැබූ ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත 2026.11.25 දිනට ප්‍රථම මෙම කාර්යාලයට ලැබෙන සේ ලේකම්, පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප), අංක 628, 10 වන මහල, ජන ජය සිරි ගොඩනැගිල්ල, නාවල පාර, රාජගිරිය යන ලිපිනයට බස්නාහිර පළාත් ප්‍රධාන ලේකම් මගින් එවිය යුතුවේ. මෙම නිවේදනයට පරිභාහිරව පිළියෙලකරන ලද ඕනෑම අයදුම්පතක් කිසිදු දැනුම්දීමකින්තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

06. තෝරා ගැනීමේ ක්‍රමවේදය:-

I. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පවත්වා සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව පවත්නා පුරප්පාඩු සංඛ්‍යාව අනුව හෙද සේවයේ විශේෂ ශ්‍රේණියට උසස් කිරීමෙන් අනතුරුව බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) (Matron) තනතුරට පත්කිරීම බස්නාහිර පළාත්

සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරනු ලැබේ.

II. තනතුරට පත්කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බවට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත 04හි සුදුසුකම් සපුරා පුරප්පාඩු සලකා බලන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

III. සුදුසුකම් සනාථ කිරීම සඳහා සහතිකවල පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළයුතුය.

IV. සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවියයුතු අයදුම්කරුවන් සංඛ්‍යාව අවස්ථාවෝචිත පරිදි හෙද සේවයේ I ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට පත්වූ දිනය අනුව ජ්‍යෙෂ්ඨතාවය, හෙද සේවයේ I ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුර සඳහා පත්කිරීම සඳහා වන පශ්චාත් ප්‍රාථමික හෙද විදුහලේ / ජාතික හෙද අධ්‍යාපන ආයතනයේ පුහුණුවේ අවසන් පරීක්ෂණයේදී ඔවුන් විසින් ලබාගත් ළකුණුවල කුසලතා අනුපිළිවෙල සහ අදාළ පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ.

V. මෙසේ උසස්වන නිලධාරීන් බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) යන තනතුරට පත්කරනු ලැබේ. මෙම තනතුරට උසස් කිරීමේදී සපුරාලියයුතු සුදුසුකම් ඉහත අංක 04 හි දැක්වෙන සුදුසුකම් සම්පූර්ණ කළයුතු දිනට සම්පූර්ණ කළයුතු අතර ඔබ විසින් ලබාඇති පුහුණුවට අදාළ ඩිප්ලෝමා පාඨමාලාවට අදාළව පවත්න ලද විභාගයෙහි ප්‍රතිඵල මත රේඛීය අමාත්‍යාංශය මගින් දන්වනු ලබන දිනයන් අනුව පත්කරනු ලැබේ.

VI. ජ්‍යෙෂ්ඨත්වය හා පශ්චාත් ප්‍රාථමික හෙද විදුහලේ පුහුණුවේ අවසන් පරීක්ෂණයේ දී දක්වා ඇති කුසලතාව මත පුරප්පාඩු ස්ථාන සඳහා පත්කරනු ලැබේ. එහිදී I ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට උසස්වී එකම දින සේවයට වාර්තා කළ නිලධාරීන් සිටියහොත් ඔවුන්ගේ පශ්චාත් ප්‍රාථමික හෙද විදුහලේ හදාරණ ලද වාට්ටු කළමනාකරණ හා අධීක්ෂණ පුහුණු පාඨමාලාවේ අවසන් පරීක්ෂණයේදී ලබාගත් කුසලතාවය ද සමාන වන්නේ නම්, ඔවුන්ගේ හෙද සේවයේ ශ්‍රේණිගත උසස්වීමේ ජ්‍යෙෂ්ඨත්වය සහ මුල්පත්වීමේ දිනය සලකා බලනු ලැබේ.

07. විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට උසස් කරනු ලබන උසස්වීම ක්‍රියාත්මක දිනට බලපවත්වනා චක්‍රලේඛ අංක 03/2016 හෝ 10/2025 හි විධිවිධානවලට අනුකූලව වැටුප් ගෙවනු ලැබේ.

08. එසේ විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට පත්කල නිලධරයකු තනතුරට පත්කිරීමෙන් පසු සති දෙකක් තුළ අදාල තනතුරේ සේවය සඳහා වාර්තා කලයුතු අතර එසේ නොකළහොත් අදාළ නිලධාරාගේ උසස්වීම අවලංගු වේ.

09. පත්වීම් සඳහා තෝරාගන්නා අයදුම්කරුවන් රජයට අතිරේක වියදමක් නොවන අයුරින් කෙටි දැන්වීමකින් පත්වීම් භාරගතයුතු අතර, එසේ තනතුරට පත්කිරීමෙන් පසු සතිදෙකක් තුළ අදාළ තනතුරේ සේවය සඳහා වාර්තා නොකළහොත් අදාළ නිලධාරියාගේ පත්වීම අවලංගු වේ.

10. ඉහත කොන්දේසි යටතේ පත්වීම ලබාගැනීමට එකඟවන නිලධාරීන් පමණක්, අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අයදුම් කළයුතුය.

11. තවද මෙම නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය.

තිලක් සෙනරත්
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
බස්නාහිර පළාත.
2026.11.05

බස්නාහිර පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ **I** වෙනි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරේ සිට විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට උසස් කිරීම - **2026**

(2022/12/31 දින සිට 2026/06/30 දින දක්වා)

1. නිලධාරියාගේ / නිලධාරිණියගේ සම්පූර්ණ නම :-

   .....

2. උපන්දිනය :- .....

3. ස්ත්‍රී/පුරුෂ භාවය :- .....

4. ජාතික හැඳුනුම්පත් අංකය :- .....

5. ලිපිනය :- සේවා ස්ථානය :-

   .....

   පෞද්ගලික :-.....

6. දුරකථන අංකය :- සේවා ස්ථානය :- .....

   පෞද්ගලික :- .....

   - I ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) ලෙස උසස්වූ දිනය :-
   - I ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) ලෙස වැඩභාරගත් දිනය :-
   - අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) ලෙස උසස්වූ දිනය :-
   - අධි ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) ලෙස වැඩභාරගත් දිනය :-

7. හෙද සේවයේ I ශ්‍රේණියේ / අධි ශ්‍රේණියේ වසර 05 ක සේවා කාලය සපුරන දිනය :-
   .....
8. ජාතික හෙද අධ්‍යාපන ආයතනය / පශ්චාත් ප්‍රාථමික හෙද විදුහල මගින් හදාරන ලද වසර 01 ½ ක ඩිප්ලෝමා පාඨමාලාවේ නම සහ හදාරණ ලද වර්ෂය :-
   .....
9. විනය පරීක්ෂණයකට ලක් කර හෝ එසේ කිරීමට නියමිත නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.
10. වැටුප් රහිත නිවාඩු ලබා තිබේද ?
11. වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම් ඒ පිළිබඳ විස්තර
12. සියළුම වැටුප් වර්ධක උපයා ගෙන තිබේද?
13. වැටුප් වර්ධක උපයා ගෙන නොමැති නම් ඒ කවර හේතුවක් මතද යන්න සඳහන් කරන්න.

මා විසින් ඉහත සඳහන් කර ඇති සියළුම තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. තවද මා විසින් සපයන ලද තොරතුරු සාවද්‍ය යයි සොයා ගනු ලැබුවහොත්, විශේෂ ශ්‍රේණියේ හෙද නිලධාරී (රෝහල් සේවා) තනතුරට උසස් කිරීම සඳහා වූ සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම පිළිබඳව වූ මාගේ හිමිකම් නොසලකා හරිනු ලැබීමට ද, මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමට ද හැකි බව මම හොඳාකාරවමි දනිමි.

....

දිනය අයදුම්කරු/කාරියගේ අත්සන

14. ආයතන ප්‍රධානියාගේ නිර්දේශය

- මෙම දෙපාර්තමේන්තුවේ/රෝහලේ ..... වශයෙන් සේවයේ නියුතු ..... මිය/මයා/මෙය විසින් සපයා ඇති තොරතුරු ඇයගේ පෞද්ගලික ලිපිගොණුව අනුව පරීක්ෂා කර බැලූ බවත්, එම තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්,
- හෙද සේවයේ II "ආ/"III ශ්‍රේණියට .....දින පත් කර ඇති බවත්, ...දින සිට සේවය ස්ථිර කර ඇති බවත්,
- නිලධාරිනිය .....දින සිට හෙද සේවයේ II "අ/"II ශ්‍රේණියට හා .....දින සිට හෙද සේවයේ I ශ්‍රේණියට උසස් කර ඇති බවත්,
- .....දින සිට හෙද සේවයේ අධි ශ්‍රේණියට උසස් කර ඇති බවත්
- .....දින සිට බස්නාහිර පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහණය කර ඇති බවත්,
- අයදුම්පත් කැඳවන දිනය වන විට වසර 05ක් තුළ වැටුප් වර්ධක උපයා ඇති/නැති බවත්,
- වැටුප් රහිත නිවාඩු ලබා ඇති/නැති බවත්,
- නිලධාරියාට විරුද්ධව විනයානුකූල කටයුතු කිසිවක් ආරම්භ කර හෝ එසේ කටයුතු කිරීමට අදහස් කර ඇති /නොමැති බවත්,
- නිලධාරියාගේ වැඩ හා හැසිරීම සතුටුදායක/අසතුටුදායක බවත්,
- නිලධාරියා ප්‍රාදේශීය පරිපාලන මහජන සෞඛ්‍ය හෙද නිලධාරී තනතුරට උසස් කිරීම සඳහා වන සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් සපුරා ඇති/නැති බවත්,
- ඒ අනුව මෙම අයදුම්පත නිර්දේශ කරන /නොකරන බවත් දන්වමි) .විනය හෝ වැටුප් රහිත නිවාඩු ලබා තිබේ නම්

....

දිනය ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව

15. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ගේ නිර්දේශය

ආයතන ප්‍රධානියාගේ ඉහත නිර්දේශය සමඟ එකඟ වෙමි/ නොවෙමි.

....

දිනය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගේ අත්සන හා නිල මුද්‍රාව

16. පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය

ඉහත නිර්දේශය සමඟ එකඟ වෙමි/ නොවෙමි.

....

දිනය පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව